# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2361/07 – 2023 දෙසැම්බර් මස 04 වැනි සඳුදා – 2023.12.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරවක් කෝරළේ සුළු කොට්ඨාසයේ, කිරිවැල්දොළ (අ.ග.පි 125) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක MA/KTP/2023/14 හා 2023.04.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් දක්වෙන ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර **‘A’** – මාණික්කවත්ත – **ප්‍රමාණය: හෙක්. 4.0468**

උතුරට: සිංහරාජ රක්ෂිතය; නැගෙනහිරට: සිංහරාජ රක්ෂිතය සහ ඒ. ඩී. දළුවත්ත ලෑන්ඩ් එස්ටේට් (පුද්.) සමාගම හිමිකම් කියන මාණික්කවත්ත ඉඩම; දකුණට: ඒ. ඩී. දළුවත්ත ලෑන්ඩ් එස්ටේට් (පුද්.) සමාගම හිමිකම් කියන මාණික්කවත්ත ඉඩම: බටහිරට: ඒ. ඩී. දළුවත්ත ලෑන්ඩ් එස්ටේට් (පුද්.) සමාගම හිමිකම් කියන මාණික්කවත්ත ඉඩම සහ සිංහරාජ රක්ෂිතය.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/23/2022/FR/242.
2023 නොවැම්බර් මස 15 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”, 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 12 – 0041

1A – G 040920 – 19 (2023/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*